www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව:ආන්ඩුව නව අන්තර්ජාල සම්බාධක සූදානම් කරමින් සිටියි

## Sri Lankan government prepares new Internet restrictions

සරත් කුමාර විසිනි
2010 පෙබරවාරි 15

මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතීන් උල්ලංගනය කිරීමේ තවත් පියවරක් වශයෙන් ආන්ඩුව පිලිබඳව විවේචනශීලී වන අන්තර්ජාල වෙබ් අඩවි වාරනය කිරීම සඳහා බලධාරීන් නව පියවර ගනිමින් සිටියි. පෙබරවාරි 08 දින විපක්ෂ ජනාධිපති අපේක්ෂක ජෙනරාල් සරත් ෆොන්සේකා අත්අඩංගුවට ගැනීම ද ඇතුලු දේශපාලන විරුද්ධවාදීන් මත පුලුල් පරිමානයේ කඩාපැනීමක් සිදුවන අතරතුර, 14 දින රාත්‍රියේ වෙබ් අඩවි ගනනාවක මෙම සැලසුම පිලිබඳ වාර්තා පලවිය.

14 දින සන්ඩේ ටයිම්ස් පුවත්පත බොහෝ තොරතුරු අනාවරනය කර තිබුනි. විදුලි සංදේශ නියාමන කොමිසම (ටීආර්සී) මගින් ඉදිරියේදී කෙටුම්පත් කරනු ලබන නීති රීති යටතේ, මාධ්‍යට සම්බන්ධ සියලු වෙබ් අඩවි අන්තර්ජාලයේ මුල් ලේඛනවල ලිපිනයන් ලබාගැනීමට නම් කොමිෂන් සභාවේ ලියාපදිංචි වීම අනිවාර්ය වනු ඇත. එම ලිපිනයන් පිලිබඳව කටයුතු කරන ජාතික සීග්‍රගාමී අන්තර්ජාල උපදේශන සේවාව ද රෙගුලාසි පැනවීමට සම්බන්ධව සිටින බව ටීආර්සී නිලධාරියෙක් පුවත් පතට පවසා තිබුනි. යෝධ ගූගල් සෙවීමේ යාන්ත්‍රනයට ද සීමාවන් පැනවෙනු ඇත.

පසුගිය සතියේදී ටීආර්සී සභාපති ලෙස පත්කල ප්‍රවෘත්ති අධ්‍යක්ෂක අනුර පැල්පිට, තමන්ට ජනාධිපති මහින්ද රාජපක්ෂගෙන් උපදෙස් ලැබී නැතැයි කියා සිටිමින් මේ වාර්තා ප්‍රතික්ෂේප කලේය. කෙසේ වෙතත්, මාධ්‍ය පිලිබඳ දැඩි පාලනය අධීක්ෂනය කිරීමේ අරමුනෙන් පසුගිය සතියේදී රාජපක්ෂ, දැනටමත් තමන් දරන ආරක්ෂක හා මුදල් අමාත්‍යාංශ වලට අමතරව මාධ්‍ය අමාත්‍යාංශය ද පවරා ගත්තේය. මෙයට අන්තර්ජාල හා අනෙකුත් විද්‍යුත් තොරතුරු හුවමාරුව ද ඇතුලත් ය.

අන්තර්ජාල වාරනය ක්‍රියාත්මක කිරීමට ආධාර ලබාගැනීම සඳහා ආන්ඩුව. චීනය වෙත නැඹුරුවී සිටින බව ද සන්ඩේ ටයිම්ස් වාර්තා කලේය. අන්තර්ජාල වාරනය පිලිබඳ චෝදනා මත ගූගල් යන ගෝලීය සෙවීමේ යාන්ත්‍රනය සමඟ චීනය, ගැටුමකට මැදිවී සිටින අතර ''චීන විශේෂඥයන් කන්ඩායමක් ආක්‍රමනික වෙබ් අඩවි වාරනය කිරීම සඳහා ශ්‍රී ලංකාවට උදව් කරනු ඇතැයි'' පුවත්පත සඳහන් කලේය. ''මෙම අරමුන සාක්ෂාත්කර ගැනීමට අවශ්‍ය නවීකරනයන් සැලසුම් කිරීම සඳහා ඊලඟ දෙසතිය ඇතුලත චීනයේ මිලිටරි බුද්ධි අංශයේ විශේෂඥයන් පිරිසක් මෙරටට ලගාවනු ඇත.''

චීනය මීට පැටලීම අහම්බයක් නොවේ. නැගී එන සමාජ නොසංසුන්තාවයේ හා එරට ක්‍රියාත්මක වන දුර දිග යන අනතර්ජාල වාරනය පිලිබඳ පැතිරුනු විරුද්ධත්වය හමුවේ බීජිනය, චීනය තුල අලෙවි කරන සියලු පුද්ගලික පරිගනක ආන්ඩුවේ අන්තර්ජාල පෙරහනයේ මෘදුකාංගය සවිකරගත යුතු බවට නියෝග කර ඇත. චීන පොලිස් දෙපාර්තමේන්තුවේ විවිධ අංශ, තමන්ගේ පැරනි සෙවුම් යාන්ත්‍රනයන් වඩ වඩාත් නවීකරනය කරමින් සිටියි. ඒවා වඩාත් දියුනු දත්ත පදනම් කරගත් විධික්‍රමයන් යොදාගනිමින් අන්තර්ජාලයේ දැවැන්ත ප්‍රමානයක තොරතුරු විශ්ලේෂනය කිරීමේ පහසුකම් අත්කරගෙන සිටියි.

පසුගිය මැයි මාසයේදී පරාජයට පත්කරන ලද බෙදුම්වාදී එල්ටීටීඊයට එරෙහි යුද්ධයේ අවසන් වසර හතර තුල ආයුධ සම්පාදනය මෙන්ම මූල්‍ය හා දේශපාලන ආධාර ද ලබාදුන් චීනය මත ආන්ඩුව වඩ වඩාත් එල්බී සිටියි. එයට හිලව් වශයෙන් චීනයට, දකුනේ හම්බන්තොට ප්‍රධාන වරායක් ඉදිකිරීම ද ඇතුලු ආයෝජන අවස්ථාවන් සලසාදී තිබේ. එක්සත් ජනපදය සමඟ වර්ධනය වන ගැටුම් වලට ප්‍රතිචාර වශයෙන් චීනය. සියලු මහාද්වීපයන්හි ආන්ඩු සමඟ මූලෝපායාත්මක සන්ධානයන් ගොඩනගා ගැනීමට නැඹුරුවී සිටින අතර ලංකාව ඉන් එකකි.

අන්තර්ජාල ලිපි හා ලේඛනවල අඩංගුවනදෑ නිරීක්ෂනය කිරීමේ විද්‍යුත් විපරම්කිරීමක කටයුතු වල චීන ඉංජිනේරුවන් නිරතවනු ඇතැයි පලවන වාර්තා පැල්පිට විසින් ප්‍රතික්ෂේප කලේය. කෙසේ වුවත් නව නියාමනයක අවශ්‍යතාවය ඔහු අවධාරනය කරයි. ''අපට

තවමත් එවන් නියාමන ක්‍රියාවලියක් අවශ්‍ය වන්නේ නැත. එහෙත්, අන්තර්ගත දෑ නිරීක්ෂනය හා නියාමනය සඳහා විධිමත් ක්‍රමවේදයක් තිබිය යුතු බව මගේ අදහසයි.'' අන්තර්ගත දෑ දේශපාලන, සංස්කෘතික, ආගමික හෝ අසභ්‍ය යන කවරක් වුවත් ''එයින් සමාජය තුල ගැටලු ඇතිකරන්නේ'' නම් ඒවා පිරික්සා බැලිය යුතුය.

ආන්ඩුව විවේචනය කරමින් තැතිගත් පනිවිඩ යැවූ හා ෆේස්බුක් වල සටහන් තැබූ මිනිසුන් හඹා ගිය බව ද පැල්පිට ප්‍රතික්ෂේප කලේය. කෙසේ වෙතත්, ආන්ඩුව මැතිවරන දූෂනයේ යෙදුනු බව සඳහන් කරමින් ලිඛිත දුරකථන පනිවිඩ යැවීමේ චෝදනාව එල්ල කරමින් පොලිසිය දැනටමත් විපක්ෂයේ ආධාරකරුවන් බොහෝ දෙනෙක් අත්අඩංගුවට ගෙන තිබේ. ජාතික ආරක්ෂාව පිලිබඳ මාධ්‍ය මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ලක්ෂ්මන් හුලුගල්ල *ටයිම්ස්* පත්‍රයට පැවසුවේ ''පුද්ගලයන් සුලු පිරිසක් අත්අඩංගවට ගෙන ඇති අතර පරීක්ෂන අවසන්වූවායින් පසුව අවශ්‍ය පියවර ගනු ඇත.'' යනුවෙනි. පුද්ගලයන් කී දෙනෙක් අත්අඩංගුවේ සිටින්නේ ද හා ඔවුන්ට විරුද්ධව ඇති චෝදනාවල ස්වභාවය කවරාකාර දැයි හෙලි කිරීම ඔහු ප්‍රතික්ෂේප කලේය.

''ආගමික හා සංස්කෘතින වටිනාකම්'' හා ''ජාතික ආසක්තයන්'' ආරක්ෂා කිරීමේ කඩතුරාව යටතේ ජනතාවට ඇසිය හැකි හා දැකිය හැකි දේ මත අත්තනෝමතික දේශපාලන ග්‍රහනයක් පිහිටුවනු ඇත. ජනසංනිවේදන හා තොරතුරු අමාත්‍යාංශයේ උපදේශක චරිත හේරත් මෙසේ පැවසීය. ''අපගේ ජාතික අවශ්‍යතා ආරක්ෂා කරගත යුතුව ඇති බැවින් අන්තර්ගතදෑ නියාමනය පිලිබඳ විවාදයක් තිබීම වැදගත්ය.''

අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට හා අනෙකුත් අයගේ අදහස් දැනගැනීමේ අයිතියට එරෙහිව ආන්ඩුවේ ප්‍රහාරයක නව අදියරක් මෙම සූදානම මගින් සලකුනු කරයි. ආන්ඩුව විද්‍යුත් මාධ්‍ය කෙරෙහි විශේෂ අවධානයක් යොමුකර ඇත්තේ, විදුලි සංදේශ කර්මාන්තයේ ගනන් බැලීම්වලට අනුව රට තුල ජංගම දුරකථන භාවිතා කරන්නන් මිලියන 13 ක් හා අන්තර්ජාලය භාවිතා කරන්නන් මිලියනයක් සිටින බැවිනි.

පසුගිය සිව් වසර පුරා රාජපක්ෂ ආන්ඩුව මාධ්‍යට එරෙහි ප්‍රහාරය දැඩි කර ඇත. එය එල්ටීටීඊ හිතවත් *ටැමිල් නෙට්* හා *ටැමිල් කැනේඩියන්* වෙබ් අඩවි අවහිර කලේය. තහනම තව දුරටත් ක්‍රියාත්මකය. මෑතදී පැවති ජනාධිපති මැතිවරන ව්‍යාපාරය තුලදී බලධාරීන්, *ලංකානිව්ස්* හා *නිදහස* වෙබ් අඩවි අවහිර කලේය.

වසර 2006 හා 2009 අතර තුර අඩුම තරමින් මාධ්‍යවේදීන් ද ඇතුලුව මාධ්‍ය සේවකයන් 14 දෙනෙක් මෙරට තුල ඝාතනයට ලක්විය. බොහෝ දෙනෙක් අඩන්තේට්ටමට, තර්ජනයට, පහරදීමට හෝ අත්අඩංග-වට ගැනීමට ලක්විය. සිය ජීවිතවලට තර්ජන එල්ලවීම නිසා දුසිමක් පමන රට හැර ගියහ. සෑම අවස්ථාවකදීම ඇඟිල්ල දිගු වූයේ මිලිටරිය සමඟ අත්වැල් බැඳගෙන ක්‍රියාත්මක වන ආන්ඩු ගැති ඝාතක කල්ලිවල කටයුතු වෙතය. අපරාධකරුවන් කිසිවෙකුත් අත්අඩංගුවට ගෙන හෝ අධිකරනය හමුවට පමුනුවා දඬුවම් කර නැත.

වසරකට පෙර *එම්ටීවී=සිරස* විකාශන ජාලය ආයුධ සන්නද්ධ මැරයන් විසින් සුනු විසුනු කල අතර තවත් අවස්ථාවකදී සතිපතා පලවන *සන්ඬේ ලීඩර්* පුවත්පතේ කතෘ ලසන්ත වික්‍රමතුංග කොලඹ අධි ආරක්ෂිත මිලිටරි කලාපයකදී මහ දවල් මරාදමනු ලැබිනි.

පසුගිය සැප්තැම්බරයේදී කොලඹ අධිකරනය, ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත හා හදිසි නීතිය යටතේ දෙමල මාධ්‍යවේදී ජේ.එස් තිස්සනායගම් පෙර නොවූ විරූ ආකාරයකට බරපතල වැඩ සහිතව විසි වසරකට සිරගත කලේය. වසර 2006 දී හා 07 දී ඔහු, එල්ටීටීඊ යට විරුද්ධව ආන්ඩුව විසින් යලි ඇරඹූ යුද්ධය හා දෙමල සිවිල් වැසියන් කෙරෙහි එහි බලපෑම විවේචනය කරමින් *නෝර්ත් ඊස්ටන් මන්ත්ලි* නමැති සඟරාවට ලියන ලද ලිපි දෙකක් මුල්කරගෙන ඔහුට එරෙහිව චෝදනා නගනු ලැබිනි.

ජනවාරි 26 දින ජනාධිපතිවරනයට සමගාමීව තවත් මාධ්‍ය අතුරුදහන්වීම් හා අත්අඩංගුවට ගැනීම් දෙකක් සිදු විය. *ලංකාඊනිව්ස්* හි සේවය කල මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ ජනවාරි 24 දින සිට අතුරුදහන්ව සිටියි. මැතිවරනයෙන් දින කීපයකට පසුව, විපක්ෂයේ ජනතා විමුක්ති පෙරමුනට සහාය දක්වන ලංකා පුවත්පතේ කතෘ චන්දන සිරිමල්වත්ත අත්අඩංගුවට ගෙන රඳවාගෙන සිටියි.

විපක්ෂ අපේක්ෂක ෆොන්සේකාගේ අත්අඩංගුවට ගැනීම වනාහි, ජෙනරාල්වරයාට සහයෝගය දුන් විශ්‍රාමලත් හමුදා නිලධාරීන් හා තවත් අය රඳවා තැබීමට සම්බන්ධ වඩා පුලුල් දැලක කොටසක් වෙයි. අන්තර්ජාල වාරනයක් ඇටවීමේ මෑතම සූදානම පොලිස් රාජ්‍යයක් ස්ථාපිත කිරීමේ දිසාවට තබන තවත් පියවරයන්ය. මෙම වැඩකටයුතු, පසුගිය සතියේදී අප්‍රේල් 08 දිනට නියම කරන ලද පාර්ලිමේන්තු මැතිවරනය ආසන්න වෙත්ම විරුද්ධ පක්ෂය මැඩපැවැත්වීම සඳහා යොදාගැනීමට නියමිතව ඇත.


© www.wsws.org